# කැලණිය විශ්වවිද්‍යාලය , ශ්‍රී ලංකාව

## <u>උපාධි ප්‍රදානය කිරීම 2021</u>

කැලණිය විශ්වවිද්‍යාලයේ සියළුම පීඨවල (පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය සහ වෛද්‍ය පීඨය හැර) **උපාධි අපේක්ෂකයින් අතුරින් 2020 වර්ෂයේ පවත්වන ලද අවසාන උපාධි පරීක්ෂණ සම්පූර්ණකොට විශ්වවිද්‍යාලයේ සනාතන සභාව මගින් ප්‍රතිඵල අනුමත කර ඇති උපාධිලාභීන් හට 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ අංක 53 (1) හි ප්‍රතිපාදන මත උපාධි ප්‍රදානෝත්සවයක් නොපවත්වා උපාධි සහතිකපත් පිරිනැමීමට තීරණය කර ඇත.** එම උපාධිලාභීන් සඳහා රටතුළ පවතින වසංගත තත්වය සමනය වූ පසුව සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව විධිමත් උත්සවයක් (graduation ceremony) ඉදිරි දිනයකදී පැවැත්වීමටත් විශ්වවිද්‍යාලය තීරණය කර තිබේ.

ඒ අනුව, ඉහත දක්වා ඇති පරිදි උපාධිලාභීන් විසින් පහත වෙබ් ලිපිනය ඔස්සේ ඇතුළත් වී අයදුම්පත්‍රය හා සියළු උපදෙස් බාගත කර නිසි පරිදි සම්පූර්ණ කර **2021 නොවැම්බර් මස 20 දිනට** පෙර **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/විභාග අංශය, කැලණිය විශ්වවිද්‍යාලය** වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල මගින් එවිය යුතු වේ. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ. තවද, ඉහත දිනට පෙර අයදුම්පත් **එවනු නොලබන උපාධිලාභීන්ගේ නම් ද** අනුමත ප්‍රතිඵල ලේඛනවල සඳහන්ව ඇති පරිදි සනාතන සභාව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන අතර එහි සඳහන් වන පරිදි උපාධි සහතිකයේ නම සටහන් කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි. එසේම **<u>උපාධි සහතිකය සකස් කළ පසු සංශෝධනයන්ට ඉඩ දෙනු නොලැබේ.</u>**

උපාධිලාභීන් විසින් උපාධි සහතිකයේ තමාගේ නම නිවැරදිව සටහන් විය යුතු අකාරය සිංහල භාෂාවෙන් සහ ඉංග්‍රීසි භාෂාවෙන් තම අත් අකුරින් හෝ යතුරුලියනය කර එවිය යුතුය. එලෙස නම නිවැරදිව එවනු නොලබන උපාධිලාභීන්ගේ උපාධි සහතික පසුව සංශෝධනය කිරීමට අවස්ථාවක් නොලැබෙන බව කාරුණිකව දන්වමි.

**සැ.යු :- උපාධිලාභීන්ගේ පහසුව පිණිස මේ සඳහා සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියළුම පීඨවල උපාධි ලාභීන්ගේ නම් ලැයිස්තුවක් ද පහත වෙබ් ලිපිනයට අන්තර්ගත කර ඇත. මේ සඳහා අයදුම් කළ හැක්කේ මෙම ලැයිස්තුවේ නම් සඳහන් උපාධිලාභීන් සඳහා පමණි.**

**වෙබ් ලිපිනය : https://news.kln.ac.lk**

**සටහන : රටේ පවතින කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් පරිපූර්ණ උපාධි ප්‍රදානෝත්සවයක් පැවැත්වීමට අවස්ථාවක් නොමැති බව දන්වා සිටින අතර ඡායාරූප ගැනීම සඳහා පමණක් ඉදිරියේදී යම් උත්සව අවස්ථාවක් ලබා දීමට කටයුතු කරනු ලැබේ. උපාධි සහතිකය නොමැතිව රැකියා සඳහා අයදුම් කිරීමේදී, විදේශගතවීමේදී සහ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමේදී සිසුන් වෙත ඇති වන ගැටළු අවම කිරීමේ පරමාර්ථයෙන් උපාධි ප්‍රදානෝත්සවයක් නොපවත්වා උපාධි සහතිකය ලබා දීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයක් වශයෙන් මෙම අවස්ථාව ලබා දෙනු ලැබේ. රට තුළ පවතින සෞඛ්‍ය නීතිරීති අනුව මේ සම්බන්ධව ඉදිරි කටයුතු විශ්වවිද්‍යාලය විසින් තීරණය කර උපාධි ලාභීන්හට දන්වනු ඇත.**

ලේඛකාධිකාරී
කැලණිය විශ්වවිද්‍යාලය
2021.10.31